පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 07

සතිය - 17 වන සතිය

සැකසුම -පුෂ්පා දමයන්ති මිය
ර/ රජවක විද්‍යාලය .

# උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය.

සමාජය යහපත් මඟට යොමු කරවන,සාරධර්ම,සිරිත් විරිත්,වැඩිහිටියන් විසින් ලබා දුන් ආත්තෝපදේශ ආදිය ඇතුළත් ගීත, උපදේශාත්මක ගී ලෙස හඳුන්වාදිය හැක.එවැනි ගීතයක් ලෙස පහත ගීය හඳුන්වා දිය හැක

**උපදේශාත්මක ගී**

පාන් කිරිත්තා තක්කිට තරිකිට උඩ පැන පැන නටතෙයි
පාන් කිරිත්තී රබාන අරගෙන කරබාගෙන වයතෙයි
උන්ගේ පැටවුන් වටේට ඉඳගෙන දැතින් හඬ තලතෙයි
මේවා බල බල කළු කැදෑත්තෙක් කීචි බීචි කියතෙයි

පාන් කිරිත්තා තමන්ගේ පාඩුවේ නැටුම පටන් ගත්තේ
අහල පහල කිසිවෙකුටත් ඒකෙන් හිරිහැරයක් නැත්තේ
කොහේද ඉඳගෙන කළු කැදෑත්තා වහලා අර අත්තේ
උන්ගේ නැටුමට බාදා කරමින් ගීය පටන් ගත්තේ

පාන් කිරිත්තා නැටුම නවත්තා කේන්තියෙන් ආවා
කැදැත්තාගේ කලු අත්තටුවෙන් අල්ලා සෙලවුවා
ඊට පස්සේ උඟ සටසට ගලා මොන මොනවද කීවා
ළඟට කිට්ටු වී මා ද ගොළුවතින් ඊට සවන් පෑවා

අනුන්ගෙ වැඩ ගැන විවේචනය කර කර ඉන්නවට වඩා
තමන් දන්න දේ හරියට කරපන් කියලා කීය හඬා

ගායනය - ෆ්‍රෙඩී සිල්වා
පද මාලාව - ප්‍රේම කීර්ති ද අල්විස්

# පාන් කිරිත්තා ස්වර ප්‍රස්තාරය

## Introduction

| | | | |
|---|---|---|---|
| ස̇ස̇ස̇ස̇· ස̇ස̇ස̇ස̇· ස̇ස̇ස̇ස̇· ස̇ස̇ස̇ස̇· | ස̇ස̇ස̇ස̇· +ස ස රි | ම +ස ස රි | ම +ස ස රි |
| මග මග මග මග | ප +ස ස රි | ග +ස ස රි | ග +ස ස රි |
| ගරි ගරි ගරි ගරි | ම +ධ ධ නි | ස̇රි̇ ස̇නි ධප මප | නිධ පම ගරි ස- |
| මම මග මප ධ | නිනි නිධ පධ ප | ගග ගරි ගම ප | නිනි නිධ පධ ම |

## Song

| | | | |
|---|---|---|---|
| ස̇ -නි ධ ප | ම මම ම මම | ම මප ග ම | ප - - - |
| නි -ධ ප ම | ග ගග ග ගග | ග ග රි ග | ම - - - |
| ස̇ස̇ -නි ධ ප | ම මම ම මම | ම මම ග ම | ප - - - |
| ග ගග ම ප | ග ගග ම ප | නි -ප ධ -ම | ප - ම - |

## Interlude

| | | | |
|---|---|---|---|
| ස̇ ස̇ ස̇ රි̇ග̇ | ස̇ ස̇ ස̇ නිධ | ස̇ ස̇ ස̇ රි̇ග̇ | ස̇ ස̇ ස̇ නිධ |
| මධ පම ධප මම | පනි ධප නිධ පප | ධස̇ නිධ ස̇නි ධධ | ස̇ -ම පධ නිස̇ |
| රි̇+ නි+ රි̇+ නි+ | ස̇+ ධ+ ස̇+ ධ+ | රි̇නි ස̇ධ නිප ධම | මප ධනි ස̇ - |

## Verse

| | | | |
|---|---|---|---|
| ධධ -ධ නි ස̇ | ධධ -ධ නි ස̇ | ග̇ග̇ -ග̇ රි̇ ස̇ | රි̇ - - - |
| පනි -නි නි නි | පනි -නි නි ස̇ | ස̇ග̇ ග̇- රි̇ග̇ රි̇ස̇ | ස̇ - - - |
| ග̇- ග̇ග̇ -ග̇ ග̇ | ස̇රි̇ රි̇ග̇ රි̇ස̇ නි | ස̇රි̇ රි̇ස̇ නි ධනි | ස̇ -නි ධප මග |
| ග ග ම ප | නි නි ධ පම | ගම පම පම ම | ම - - - |

උපදේශාත්මක ගී

හිතන්නකෝ අයියේ - දූන්වත් හැදෙන්නකෝ අයියේ
දඟ ළමයින් නරකයි බෝ සැරයි
හොඳ ළමයට කවුරුත් ආදරෙයි
සෙල්ලම ලෙල්ලම වෙනවාමයි
ඒකෙත් ඇස් රතු වෙනවාමයි

මැර කොල්ලන් එක්කල හාදකම්
උඩ පැනිලී හැවිලී නාඩගම්
හොඳ නෑ කැතයි - චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ -
හිතන්නකෝ අයියේ ....

එකටෙක නොකියා වාද වෙලා
ගුරු දෙගුරුන් හට මෙල්ල වෙලා
හැදුනේ නැත්නම් අයියා මගේ
බලු වලිගේ වාගේ මයි ඇදේ
හොඳ නෑ කැතයි, චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ ...

පොඩි අපි දෙන්නා ඇස් දෙක වාගේ අම්මා සළකාවී
උදේ සවස වැඳ පුදන්න අම්මා
දෙවියොත් සළකාවී හා හා..
හොරකම් මැරකම් එපා එපා
බොරු කීවෝතින් පව් සිදුවේවී
නංගී පොඩි හැම කාලෙදී
අයියා ගාවයි.
හිතන්නකෝ .......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - කරුණාරත්න අබේසේකර

උපදේශාත්මක ගී

හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මව්බිම ඉපදී ඉන්නේ
අත් පොඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරිලක් අම්මා//

හොරකම් මැරකම් නැතිව ලොවේ
සිටියොත් හොඳ නම නිතර ලැබේ
වැරදි කළොතින් පව් සිදු වේවී
සමාව නම් කිසි දිනෙක නැතේ
පොඩි ළමයින්හට දෙවියන්ගේ
ආශිර්වාදය මයි ඔනේ

අත් පොඩි ටික.......

අම්මාගෙන් කරුණාව සෙනේ
විරිය දහිරිය පියතුමගේ
මේ හැම ලැබුණොත් එකවාගේ
මුළු ලෝකේම එයි අතට අපේ
පොඩි අයමයි ලොකු අය වෙන්නේ
කෝපය හින්දයි පොඩි වෙන්නේ
හිත තුල වෛරය නැති කරලා
ඉන්න ඕනේ හොඳ ළමයි වෙලා
අත් පොඩි ටික......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - විල්ෆ්‍රඩ් සිල්වා



පැවරුම-

01.ඉහත ගීත වලින් ඔබට ලබාදෙන උපදෙස් ලියන්න

02.අන්තර්ජාලය හෝ වෙනත් ක්‍රම මඟින් උපදේශාත්මක ගී අසා රසවිඳින්න.

03. උපදේශාත්මක ගීත රචකයින් සහ ගායක/ගායිකාවන්ගේ ලැයිස්තුවක් සකසන්න.

04. . උපදේශාත්මක ගීත වලින් ඇති ප්‍රයෝජන ලියන්න.

05. . උපදේශාත්මක ගීත ලැයිස්තුවක් සකසන්න.